මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

5 ශ්‍රේණිය

# මව්බස

**1. වගුව සම්පූර්ණ කරන්න.**

| පිල්ලේ නම | පිලි | නියෝජනය වන ස්වරය |
|---|---|---|
| ඇලපිල්ල | ා | ආ |
| කෙටි ඇදපිල්ල | | |
| දික් ඇදපිල්ල | | |
| කෙටි ඉස්පිල්ල | | |
| දික් ඉස්පිල්ල | | |
| කෙටි පාපිල්ල | | |
| දික් පාපිල්ල | | |
| කොම්බුව | | |
| කොම්බුව සහිත හල් කිරීමේ ලකුණ | | |
| කොම්බුව සහිත ඇලපිල්ල | | |
| කොම්බුව, ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ | | |

**2. පහත සඳහන් වගන්ති නිවැරදි අංග,ප්‍රමාණ,හැඩ සහිත ව,නිවැරදි ව පද වෙන්කර බලා ලියන්න.**

(1) සුගන්ධවත් පුෂ්පයෝ අපගේ සොහොයුරියෝ ය.

(2) ගංගාවෝ අපගේ සොහොයුරෝ වෙති.

(3) මිනිසා මිය ගියත් කළ හොඳ ඉතුරු වේ.

(4) පුංචි අපට සිරි සැප දෙයි සිරි ලංකා දීපේ.

(5) ඉවත දමන දඬුව වුව ද දලු ලා යළි පැළ වේ.

3. දී ඇති අකුරට අදාළ පිල්ල යොදා වචන ලියන්න.

| පිල්ල | බ | ල | ර | ක | ද |
|---|---|---|---|---|---|
| ඇලපිල්ල | | | | | |
| කෙටි ඇදපිල්ල | | | | | |
| දික් ඇදපිල්ල | | | | | |
| කෙටි ඉස්පිල්ල | | | | | |
| දික් ඉස්පිල්ල | | | | | |
| කෙටි පාපිල්ල | | | | | |
| දික් පාපිල්ල | | | | | |
| කොම්බුව | | | | | |
| කොම්බුව සහිත හල් කිරීමේ ලකුණ | | | | | |
| කොම්බුව සහිත ඇලපිල්ල | | | | | |
| කොම්බුව, ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ | | | | | |

**4. පහත සඳහන් ඡේදය නිශ්ශබ්ද ව කියවන්න.**

වනාන්තරය එළිපෙහෙළි කර වර්ෂාව එන තෙක් ගොවියෝ බලා සිටිති. කාලගුණ වාර්තා අනුව හේන් ගොවිතැනට වර්ෂාවෙන් ජලය ලැබෙන්නේ අගෝස්තු සිට ඔක්තෝබර් තෙක් මාසවල දී ය. ගොවියෝ ලී කොට සිටුවා වන සතුන්ගෙන් වගා ආරක්ෂා කර ගැනීමට වැටක් නිර්මාණය කරති. මෙසේ මහන්සි වන ගොවීන්ගේ එක ම වෑයම වන්නේ වන සතුන්ගෙන් බෝගවලට සිදුවිය හැකි විනාශය වළක්වා ගැනීම යි. වීර්යය අත් නොහැර රෑ දවල් මහන්සි වන ගොවියෝ තම බෝග වැඩෙන ආකාරය දැක සතුටු වෙති.

ඔවුන් වඩාත් ම සතුටු වන්නේ තම අස්වැන්න හොඳ මිලකට වෙළඳාම් කර ගැනීමට හැකි වූ විට ය. හේන් ගොවිතැන වෘත්තිය කරගත් ඔවුන් බොහෝවිට වේදනා විඳින්නේ වන සතුන්ගෙන් වගා විනාශ වූ විට ය. වන සතුන් ද වටිනා සම්පතකි. වන සතුන්ගෙන් බෝග ආරක්ෂා කිරීමට කටයුතු කරන්නේ නම්, සතුන් කෙරෙහි මිනිසුන්ට ඇති වන වෛරය අවම කරගත හැකි වේ. එයින් වන සතුන් ද ආරක්ෂා වේ.

**ඡේදයෙන් "ව" අකුරෙන් පටන් ගන්නා වචන සොයා, කොටුවල ඇති ශබ්දවලට(ස්වරවලට) අදාළ ව ලියන්න.**

| | | | | | |
|---|---|---|---|---|---|
| අ | | ආ | | ඇ | |
| ඈ | | ඉ | | ඊ | |
| උ | | ඌ | | ඍ | |
| ඎ | | එ | | ඒ | |
| ඓ | | ඔ | | ඕ | |
| ඖ | | | | | |

❖ **සිංහල කියවීම් පොත කියවා ඒ ඇසුරින් තවත් මෙවැනි ක්‍රියාකාරකම්වල යෙදෙන්න.**

5. **පහත සඳහන් වචනවල ඉරි ඇඳි අකුරට යෙදී ඇති පිල්ල සොයා යා කරන්න.**

| | |
|---|---|
| තුඹ | කෙටි කොන් පාපිල්ල |
| රුවන්වැල්ල | දික් කොන් පාපිල්ල |
| නූල | කෙටි වක් පාපිල්ල |
| රුපින | දික් වක් පාපිල්ල |
| කූඹියා | කෙටි ඇදපිල්ල |
| රූපය | දික් ඇද පාපිල්ල |
| සුවඳ | දික් ඇදපිල්ල |
| රූන | කෙටි ඇද පාපිල්ල |

6.

| | | | |
|---|---|---|---|
| ව | ප | ද | ත |
| ස | හ | න | |
| ම | ග | ල | |

**කොටුව තුළ ඇති අකුරුවලින් පටන් ගන්නා වචන යොදා පහත වගුවේ තීරු සම්පූර්ණ කරන්න.**

| අකුර | ගැහැනු | පිරිමි | මල් | පලතුරු | සත්තු | නගර |
|---|---|---|---|---|---|---|
| ක | කමලා | කාවින්ද | කැනාස් | කෙසෙල් | කූඹියා | කෑගල්ල |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

7. **පහත සඳහන් ඡේදය නිශ්ශබ්ද ව කියවන්න.**

නිවාඩුව එළඹෙන තෙක් දර්ශන බලා සිටියේ අත්තම්මාගේ දානේ ගෙදර යාමට ය. අත්තම්මලාගේ නිවස පිහිටා තිබුණේ දැකුම්කලු පරිසරයක ය. ගමේ පරිසරය දැකීමට අපේ දෑස් පින් කර ඇති බව තාත්තා කියයි. නිවස පිටුපසින් ගලා යන ඇළේ දිය නෑමට දර්ශන බෙහෙවින් ආශා කරයි. ගමේ දී දර්ශන සමග සෙල්ලම් කිරීමට දීපාල් ද එක් වෙයි. ගමේ සිට නගරයට පැමිණීමට ඇති ගමන් මග ඉතා දුෂ්කර ය. එහෙත් නගරයේ මෙන් ගමේ පරිසරය දූෂණය වී නැත. ගමේ පවතින නිසංසල බව අපගේ සිත් සතුටු කරවයි. ගමේ හා නගරයේ පවතින්නේ දෙආකාරයක දේශගුණ තත්ත්වයකි. ගමේ පවතින දේශගුණය නිසා ගස්වැල් පලින් බර වී තිබේ.දෛනික ව ආහාර සොයා එන කුරුල්ලන්ගේ කිචි බිචි නාදය පරිසරය තවත් අලංකාර කරයි. දහවල් කාලයේ දොළ කරා දිය නෑමට යන දර්ශන හා දීපාල් සවස් වනතුරු ම සෙල්ලම් කරති. දීපාල්ගේ මවගේ කටහඬෙහි දෝංකාරය ඇසෙත් ම දොලෙන් ගොඩ වීමට සිදුවන බව දෙදෙනා ම දනිති.මවගේ හඬට අවනත වන දරුවෝ රෑ බෝවන්නට පෙර නිවසට එති.

(1) ඡේදයේ ඉරි ඇඳ ඇති වචන ශබ්ද නගා කියවන්න.

(11) එම වචනවල "ද"අකුර සමග ඇසෙන ශබ්දය ලියන්න.

| | | |
|---|---|---|
| දර්ශන .......... | දීපාල් ........... | දහවල් ............... |
| දානේ .......... | දුෂ්කර .......... | දොළ ............... |
| දැකුම්කලු ......... | දූෂණය .......... | දෝංකාරය ......... |
| දැකීමට ........... | දෙආකාරයක......... | දෙදෙනා ............ |
| දෑස් ................. | දේශගුණ ............. | දරුවෝ ............ |
| දිය ................. | දෛනික................. | |

8.(1) සිංහල කියවීම් පොතේ "මහපටැඟිල්ලක අරුමය"පාඩම විරාම ලකුණු පිළිබඳ සැලකිලිමත් වෙමින් ශබ්ද නගා කියවන්න.

(11) පාඩම ඇසුරෙන් තිත,ප්‍රශ්නාර්ථ ලකුණ,කොමාව,යුගල උඩු කොමාව, සරල වරහන් ඇති වගන්ති බලා ලියන්න.

(111) පහත වගන්තිවල විරාම ලකුණු නිවැරදි ව යොදන්න.

- හැමෝටම තේරුණා ද පවනි ඇසුවා ය
- සියලු දෙනා ම සතුටින් ක්‍රීඩාවේ නිරත වූහ
- හරි අපූරු කතාවක් නේ මට කියවුණෝ ඉබේට ම ය
- අත්තම්මා කියා දුන් කවි කතා ජන ප්‍රවාද ළමයින්ට මතක් විය
- වඩින්න යන මේ නඩේට මේ තුන් සරණෝ සරණයි
- ලොකු අම්මා තාත්තාගේ ලොකු අයියාගේ බිරිඳ ඇගේ සිහිනවල වීරවරිය යි